# බුද්ධ ප්‍රමුඛ සංඝරත්නය කෙරෙහි පූජා කිරීම

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

උතුම් වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්ස, බුද්ධ ප්‍රමුඛ වූ සංඝරත්නය විෂයෙහි, අප විසින් සද්ධා ගෞරව සහිතව, සකසන ලද, අපගේ මෙම ආහාරමය දානය ද පානීය දානය ද අතුරුපස දානය ද සෙසු පිරිකර දානයන්ද පුෂ්ප පූජාව ද සුවඳ පූජාව ද ආලෝක පූජාව ද, අපගේ නිවන පිණිසම, අප කෙරෙහි අනුකම්පාවෙන්ම, පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

උතුම් වූ විජ්ජාචරණ සහිත වූ සුගත වූ සියලු ලෝකයන් දන්නා වූ කෙළෙස් ලෙඩට මහා වෙදැදුරු වූ ලෝකනාථ වූ මහා ධර්ම දේශකයාණන් වහන්ස, බුද්ධ ප්‍රමුඛ වූ සංඝරත්නය විෂයෙහි, අප විසින් සද්ධා ගෞරව සහිතව, සකසන ලද, අපගේ මෙම ආහාරමය දානය ද පානීය දානය ද අතුරුපස දානය ද සෙසු පිරිකර දානයන්ද පුෂ්ප පූජාව ද සුවඳ පූජාව ද ආලෝක පූජාව ද, අපගේ නිවන පිණිසම, අප කෙරෙහි අනුකම්පාවෙන්ම, පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

උතුම් වූ තිලෝගුරු වූ ධම්මරාජ වූ ධම්මස්සාමී වූ සියලු සත්වයනට එකම සරණ වූ සත්වයන්ගේ කෙළෙස් ගිනි නිවන්නා වූ මහා කාරුණිකයන් වහන්ස, බුද්ධ ප්‍රමුඛ වූ සංඝරත්නය විෂයෙහි, අප විසින් සද්ධා ගෞරව සහිතව, සකසන ලද, අපගේ මෙම ආහාරමය දානය ද පානීය දානය ද අතුරුපස දානය ද සෙසු පිරිකර දානයන්ද පුෂ්ප පූජාව ද සුවඳ පූජාව ද ආලෝක පූජාව ද, අපගේ නිවන පිණිසම, අප කෙරෙහි අනුකම්පාවෙන්ම, පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

# පුණ්‍යානුමෝදනාව

කෝටි ලක්ෂයක් සක්වල සියලු ආර්යයන් වහන්සේලා ද සියලු සත්පුරුෂයන් වහන්සේලා ද අපගේ නමස්කාරය පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

කෝටි ලක්ෂයක් සක්වල සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

සහම්පතී මහා බ්‍රහ්ම රාජයාණෝ ද සනත්කුමාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද සටීකාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද තිස්ස මහා බ්‍රහ්ම රාජයාණෝ ද

ශුද්ධාවාසවාසී වූ සියලූ ම අර්හත් මහා බ්‍රහ්මයෝ ද සියලූ ම අනාගාමී මහා බ්‍රහ්මයෝ ද

බ්‍රහ්ම ලෝක වාසී වූ සියලූ ම ආර්යය වූ බ්‍රහ්මයෝ ද සියලූ ම සත්පුරුෂ වූ බ්‍රහ්මයෝ ද

සදිව්‍ය ලෝක වාසී සියලු ආර්යයන් වහන්සේලා ද

මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ ද

සියලුම මහා බෝසතාණන් වහන්සේලා ද

මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ සමග පාරමී පුරන්නා වූ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි භික්ෂුභාවය, භික්ෂුණීභාවය, උපාසකභාවය සහ උපාසිකාභාවය ලබන්නා වූ පිරිසද

අනාගත බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවල භික්ෂුභාවය, භික්ෂුණීභාවය, උපාසකභාවය සහ උපාසිකාභාවය ලබන්නට පාරමී පුරන්නා වූ පිරිස ද

ශක්‍ර දේවේන්ද්‍රයාණන් වහන්සේ ඇතුළු තෙතිස් මහා දෙව් රජුන් ද උන්වහන්සේලාගේ පිරිස ද

ධ්‍රතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ නම් වූ සතර වරම් රජවරුන් ද උන්වහන්සේලාගේ පිරිස ද

සූර්ය දිව්‍ය රාජයාණන් වහන්සේ ද උන්වහන්සේගේ පිරිස ද

චන්ද්‍ර දිව්‍ය රාජයාණන් වහන්සේ ද උන්වහන්සේගේ පිරිස ද

සීත වළාහක, උෂ්ණ වළාහක, අබ්භ වළාහක, වාත වළාහක, වැස්ස වළාහක දෙව් රජුන් ද උන්වහන්සේලාගේ පිරිස ද

ස්වර්ණමාලී මහා චෛත්‍යය රාජයාණන් වහන්සේ ද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේ ද ඇතුළු සියලු සිද්ධස්ථාන ආරක්ෂා කරන්නා වූ අප්‍රමාදී වූ ධෛර්යය සම්පන්න වූ දෙවියෝ ද අනෙකුත් විශේෂ ස්ථාන ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද

අපගේ ආරක්ෂක දෙවියෝ ද අපගේ ඥාතිමිත්‍රාදීන් ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ සියලූ ම පින්,

අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙත්වා ! කලට වේලාවට, ශාසනය ආරක්ෂා කරත්වා ! දේශණය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

මියපරලොව ගියා වූ අපගේ ඥාති මිත්‍රාදීන් ද

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ සියලු ම පින්,

අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙත්වා ! කලට වේලාවට, ශාසනය ආරක්ෂා කරත්වා ! දේශණය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

# ප්‍රාර්ථනා

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ මහා පුණ්‍ය සම්භාරයෙන්, කෙටිම කාලයකින්, පහසුම ආකාරයෙන් (සුඛ ප්‍රතිපදාවෙන්), සියලු දුකින් මිදෙම්වා ! මේ සියලු කෙලෙස් බරින් නිදහස් වෙම්වා ! අජර වූ අමර වූ නිවන ලැබ සැනසෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

මේ මොහොතෙහි පටන් නිවන් දක්නා මොහොත දක්වා සැම කල්හි, සම්මා දිට්ඨික වන්නෙම්වා ! ත්‍රිහේතුක වන්නෙම්වා ! සීල සම්පන්න වන්නෙම්වා ! පහසුවෙන් සිල් රකින්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා ! නිදුක් වන්නෙම්වා ! නිරෝගී වන්නෙම්වා ! බාලයන්ගේ ඇසුර නොලබන්නෙම්වා ! බාලයන්ගෙන් අල්පමාත්‍ර හෝ බලපෑමක් ඇති නොවන්නෙක් වෙම්වා ! කළ්‍යාණ මිත්‍රයන්ට හෝ සත්පුරුෂයන්ට එරෙහිව සිතුවිලි මාත්‍රයක්වත් නූපදවන්නෙම්වා ! කළ්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර ලබන්නෙම්වා ! කළ්‍යාණ මිත්‍රයන්ගේ විශේෂ අනුකම්පාව ලබන්නෙම්වා !

සද්ධා සම්පන්න වන්නෙම්වා ! සති සම්පන්න වන්නෙම්වා ! වීර්ය සම්පන්න වන්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා !

නිර්මල පර්යාප්තිය අසන්නෙම්වා ! ධරන්නෙම්වා ! වචනයෙන් පුරුදු පුහුණු වන්නෙම්වා ! අර්ථ පිරික්සන්නෙම්වා ! නුවණින් විනිවිද දකින්නෙම්වා ! නිවැරදිව අන්‍යයන්ට දේශණා කරන්නෙම්වා !

නිදුකින් සමථය වඩන්නෙම්වා ! නිදුකින් විදර්ශණා වඩන්නෙම්වා ! කැමති කැමති තාක් සමාපත්තීන්ට කැමති කැමති තාක් කාලයක් සමවදින්නෙම්වා !

කැමති කැමති තාක් දේ නිදුකින් ලබන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙන්නෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !